# කීස්බරෝ විහාරස්ථානයේ ධම්මසරණ ධර්ම ශාලාව විවෘත කිරීමේ මහෝත්සවය



වික්ටෝරියාවේ ප්‍රථම බෞද්ධ විහාරය වන කීස්බරෝ විහාරයේ අභිනවයෙන් ඉදි කරන ලද ධර්ම ශාලා මන්දිරය 2010 ජූලි 18 වන දින සවස 2 ට උත්සවාකාරයෙන් විවෘත කෙරෙයි. 500 දෙනෙකුට එකවර අසුන් ගතහැකි තරමේ විශාලත්වයකින් යුතුව නිමවා ඇති අටපට්ටම් හැඩැති ධර්ම ශාලා ගොඩනැගිල් නූතන ගෘහ නිර්මාණ ශිල්පයේ ආශ්චර්යයක් වැන්න. මෙල්බන් වෙසෙන ශ්‍රී ලාංකික ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ සැළසුමක් වන මෙම ධර්ම ශාලා ගොඩනැගිල්ලට සමාන කළ හැකි ධර්ම ශාලා ගොඩනැගිල්ලක් ශ්‍රී ලංකාවේදී හෝ ඕසට්‍රේලියාවේ දී දැකගත නොහැකි තරම් ය. මෙම අපූරු ගොඩනැගිල්ල තුළ එකදු කුළුනක් හෝ දකින්නට නොහැකි වීම විශේෂත්වයකි. සියලු අංගෝපාංගයන් ගෙන් සමන්විත වූ මෙම ධර්ම ශලාවට පුස්තකාලයක් කාර්යාල කාමරයක් හා ගබඩා කාමරයක්ද අයත් ය.

විහාරස්ථානයේ අධිපති පූජ්‍ය නාඹටුන්නේ විජිත ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ දායකයන්ගේ කැපවීමෙන් මෙසේ මල් ඵල ගැන්වෙන විහාරස්ථාන සංවර්ධන සැළැස්මේ තුන් වන අදියරයි මේ. මෙම මහඟු පුණ්‍යකර්මය සඳහා ඇප කැප වූ පින්වතුන් අතර ඔසී ද සිල්වා, මහාචාර්ය ප්‍රියන්ත මෙන්ඩිස්, දයා සමර-කෝන්, දයාවංශ හා ලලිත් රාජපක්ෂ යන මහතුන් ඇතුළු දායක කමිටුව විශේෂයෙන් සඳහන් කළ ය.

ජූලි 18 වනදා පස්වරු 2 සිට 3 දක්වා කීස්බරෝ හි ග්‍රින්ස් රෝඩ්හි අංක 329 - 335 ස්ථානයේ පැවැත්වෙන මෙම විවෘත කිරීමේ උත්සවයට ශ්‍රී ලංකාවෙන් පූජ්‍ය උඩුවේ ධම්මාලෝක හා පිටිදූවේ සිරිධම්ම යන හිමි වරුන් සහභාගි වන අතර සිංගප්පූරුවෙන් හා ස්වීඩනයෙන්ද ස්වාමින් වහන්සේලා සහභාගි වෙති. මෙල්බන්හි වෙසෙන සියලුම බෞද්ධ සැදැහවතුන්ට මෙම පුණ්‍ය කරම්යට සහභාගි වන මෙන් විහාරාධිපති ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ දායක සභාව ආරාධනා කරති.

සටහන **ශ්‍රීනාත් මද්දුමගේ**















36 වන පිටෙන්

තැන් බෙහෝය. මේවා එකිනෙක විශ්ලේෂණය කිරීමට මා අදහස් නොකළ ද, ජී.බී. විශාදයෙන් පෙලුනේද යන විෂබීජය වැපිරීමට ඉහත වෛද්‍යවරයෙකු වන ඒ මහතා මීට වඩා පරිස්සම් විය යුතුයයි සිතමි. ජී.බී. විශාදයෙන් පෙලුනේයයි වෛද්‍යවරයෙකු හැටියට ඔහු සැකකරන්නේ නම්, ඔහු විසින් කළ යුතුව ඇත්තේ ජී.බී. ගේ සැබෑ චරිතය හා චරිත ලක්ෂණ සොයා බැලීමය. ජී.බී. ගතකළේ හුදකලා ජීවිතයක් නිසා, ඔහුගේ චරිත ලක්ෂණ ගැන නිශ්චය වශයෙන් දැන ගත හැකි එකම ක්‍රමය නම්, ජී.බී. බලා කියා ගත්, තවමත් ජීවතුන් අතර සිටින ඔහුගේ සොහොයුරාගේ දියණියන් දෙදෙනාද, ජී.බී. ගෙන් බොහෝ කාලයක් පාඩම් ඉගෙන ගත් අය්යාගේ කණිටු පුත් පාලිත වැනි අය හමු වී කථා බස් කිරීමය. එයද ඵලදායී විය හැකිද ?

ජී.බී. කෙටි කථා රචකයෙකු වශයෙන් ප්‍රසිද්ධ වීමට ඉහත, මාටින් වික්‍රමසිංහ සමඟ " දිනමිණ" පුවත් පතේ සේවය කළ බව බො-හෝ අය නොදනිති. මතු දැක්වනුයේ ප්‍රථම හමුවීමේදී මාටින් ජී.බී. දුටු ආකාරයයි. "ඔහු වහා කම්පනය වන ස්නායු (නාඩි) ඇත්තෙකියි මම සිතුවෙමි. එහෙත් ඔහු දැඩි සිත් ඇත්තෙකියි ඔහුගේ දෙ ඇස දෙස බැලූ මට හැඟිණි." (උපන් දා සිට - 363 පිටුව) ජී.බී. තරමක කාලයක් කිට්ටුවෙන් ඇසුරු කළ පසු වික්‍රමසිංහ ජී.බී. දුටුවේ මතු දැක්වෙන අයුරෙනි. -ඔහු නොනැමෙන සිතක් හා ගතියද ඇත්තෙකි. මෙය බුද්ධිමතෙකුට මිස නවකථා කාරයෙකුට හැම විට උචිත ගතියක් නොවේ. -එම - 364 පිටුව)

මාටින් වික්‍රමසිංහ එදා ජී.බී. දුටු අයුරු මෙම සාකච්ඡාවටම අදාල නොවේ යයි යමෙකුට තර්ක කළ හැකිය. මන්ද යත් කාලයාගේ ඇවෑමෙන් වයසින් මුහුකුරා යන විට පුද්ගලයෙකු වෙනස් වීම නොවැළැක්විය හැකි ක්‍රියාදාමයක් නිසාය. හැටගණන්වල මා දුටු ජී.බී. ඉතා නිහඬ, වැඩි කථා බහට නොකැමති, මහමඟ යනවිට හිස උසවා කිසිවකු දෙස නොබලන තරම් නිශ්ශබ්ද පුද්ගලයෙකු වීය. ඉඳහිට කොළඹ යන විට ඔහු යල්පැන ගිය පැරණි තනි සුදු සූට් එකක් ද,පරණ ටයි පටියක් ද, පැළඳි බව මට මතකය. ගෙවත්තේ කොනක පිහිටි නාන ලිඳ වෙත ඔහු පියවර මැන්නේද ඉතා සෙමින් බිම බලා ගෙනය. සමාජයේ මිනිසුන් හැසිරෙන ආකාරයවත්, ගෙවත්තේ ලමුන් සෙල්ලම් කරන ආකාරයවත් දැකීම ඔහුට ප්‍රිය නොවූවා සේය. සමාජ ආශ්‍රයෙන් මෙතරම් ඈත් වූ අයකු, මිනිසුන්ගේ අභ්‍යන්තරය විනිවිද දුටුවේ කෙසේදැයි, ජී.බී. ගේ සෑම නිර්මාණයක්ම කියවන විට මම තවමත් මවිතයට පත්වන්නෙමි.

අය්යාගේ ගෙදර කන්තෝරු කාමරය ජී.බී. ගේ නිවහන වීය. ඔහුගේ කාමරයේ ජනෙල් පියන් ඇර තිබෙනු මම කිසිවිටක දැක නෙමැත්තෙමි. තම කාමරයෙන් පිටත සිද්ධ වනුයේ කුමක්දැයි ඔහුට දැන ගැනීමට අවශ්‍යතාවයක් නැත්තාක් සේය. ඔහුගේ කාමරය විශාල පොත්ගුලක් වීය. ඇඳක් ද, ලියන මේසයක් ද, පුටුවක් ද එහි තිබිණි. සිගරට් කොටවලද අඩුවක් නොතිබිණි. ජී.බී. සිය කාමරයෙන් පිටතට ආවේ ඉතා කලාතුරකිනි. කියවීමත්, ලිවීමත් හැර ඔහු අන් කිසි කාර්යයක් කළ බවක් පෙනෙන්නට නොතිබිණි.

ජී.බී. සැබැවින්ම හුදකලා ජීවිතයකට ඇබ්බැහි වූයේ ලිවීමට වඩා කියවීමේ පුරුද්ද නිසායයි මම සිතමි. තරුණ වියේදී තම කියවීමේ පුරුද්ද නිසා තම මවට බඩගින්නේ පවා ඉඳීමට සිදු වූ බව ඔහු සංවේගයෙන් සඳහන් කර ඇත.

දෙනුවන් නිවී යනතුරු ජී.බී. විසින් සිදුකරන ලද්දේ ප්‍රබන්ධ කථා, කවි, විචාර වැනි සාහිත්‍ය නිර්මාණ සිය පෑන් තුඩින් බිහිකිරීම හා ශාස්ත්‍ර ඥානය ප්‍රගුණ කරනු වස් කියවීම නැමැති මෙහෙවරෙහි යෙදීමය. දෙනුවන් නිවී ගි පසුත්, ප්‍රාණය සැඟවී යනතුරු ඔහු අතින් සිද්ධ වූයේ සාහිත්‍ය නිර්මාණ තව තවත් වැඩි වැඩියන් බිහි කිරීමය. මෙවැනි උදාර සාහිත්‍ය සේවා-වක් නොබණ්ඩව කළ අයකු, විශාදයෙන් පෙලුනේදැයි පදනම් විරහිතව සැක කිරීම අසාධාරණ නොවේද ?


## Do You Want To Migrate To Australia?

**For All Your Australian Migration Visa Requirements**

- General Skilled Migration (onshore & offshore)
- Employer Nominations
- State Government Sponsorship
- Business Migration
- Family Visitor
- Spouse / De facto
- Graduate Skilled Visa Subclass 485/885 & 886
- Student Visa Extension
- MRT and RRT Appeals
- Skills Assessment

MIA
MEMBER OF MIGRATION INSTITUTE - OF AUSTRALIA -
MRAN 0958576

**We provide professional and cost effective service to our clients.**
**Step by step assistance and guidance until the end.**

## Ananda Kumarasiri

**Australian Migration Consultant**
**Dip. Marketing**
**Grd. Cert. Imm. Law -VU**
**MIB (Inr.Trade) –DU**

**Contact Details:**
No 1 Heathcote Court,Endeavour Hills,Vic 3802,Australia.
Tele/Fax +61 3 9708 1168 Mobile +61 4 2585 1577

No 88, Diyawanna Garden,Battaramulla,Sri Lanaka.
Tele/Fax +94 112 787 645 Mobile +94 773 249 923
anandakumarasiri1@gmail.com



**Professional dedication to make your dreams become a reality.**

MASS Design - Sri Lanka. www.massadvertising.net / www.mass.lk / admass@sltnet.lk